**(හැඳින්වීම)**

ආගමන සමයේ හතර වන ඉරුදින වන අද සාමයේ ඉරුදින යි.

අද දින පළමු වන දේව ප්‍රකාශනය මීකා දිවැසිවර තුමන්ගේ පොතෙන් උපුටාගෙන ඇති අතර ජුදාහි අධිපතියා වීමට කෙනෙක් බෙත්ලෙහෙමෙන් නැඟී එන බවට සමිඳාණන් වහන්සේ විසින් ලබා දුන් පොරොන්දුව සිහිපත් කරයි.

දෙවන දේව ප්‍රකාශනය තුළින් ක්‍රිස්තුන් වහන්සේ තම පියාණන් වහන්සේගේ කැමැත්තට කීකරුව, අපගේ පාරිශුද්ධිය උදෙසා ශ්‍රී සිරුර පූජා කළ බව ප්‍රකාශ කරන අතර, ශුද්ධ වූ සුපුවත මගින් මරියාවන් එළිසබෙත් තුමිය බැහැදැකීමේ පුවත ගෙන හැර දක්වයි.

ළඟ එන ක්‍රිස්තු උත්පත්ති මංගල්‍යය සැමරීමට සූදානම් වන අප සැමගේ සිත් ද ඇතුළාන්ත සාමයෙන්, බැහැපත්කමෙන් සහ අචල විශ්වාසයෙන් පුරවා, නත්තලේ සැබෑ අසිරිය අපගේ ආධ්‍යාත්මයට ද මුසු කරන මෙන් ඉල්ලා, මෙම දිව්‍ය යාගය තුළ අපි එක් හඬින් සමිඳුන් යදිමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1) ආදර දෙවි පියාණෙනී, ශුද්ධ වූ සභා මාතාව නිරන්තරයෙන් සාමයේ මාර්ගය වෙත යොමු කරවමින්, විශ්වාසයෙන් සහ බැහැපත්කමින් පිරී මෙලොව දිවි ගෙවන්නට සියලු විශ්වාසිකයන් සහ අප ආධ්‍යාත්මික එඬේරුන් ශුද්ධාත්ම වරමින් ආසිරි ගන්වන පිණිස,

2) දයාබරිත දෙවි පියාණෙනී, ක්‍රිස්තු උත්පත්තියට සූදානම් වන මෙම උතුම් කාලය තුළ උන්වහන්සේගේ ආගමනයට සුදුසු ලෙස සාමයෙන් සහ ප්‍රේමයෙන් පිරුණු නිර්මල සිත් සතන් අප තුළ ගොඩනඟා ගන්නට අවැසි දෙව් වරම් මීසම් සංඝයේ සැම වෙත දානය කරන පිණිස,

3) ආදර දෙවි පියාණෙනී, දෙව් මවුන් මෙන් අප සහෝදරයන්ගේ අවැසිතාවලට මුළු හදින් සංවේදීවන්නට සහ නපුරාගේ සියලු පරීක්ෂාවන් ජය ගනිමින් භාග්‍යවන්තකමේ උරුමය උදෙසා නිතර දිරි වඩන්නට අවැසි ශුද්ධාත්ම ආලෝකය අප ජීවිත තුළට නොමදව දානය කරන පිණිස,

4) ආදර දෙවි පියාණෙනී, සැමවිට ම අප දේශයට සහ ජන සමාජයට හිතකර, සඵලවත් තීරණවලට එළඹෙන්නට අවැසි මග පෙන්වීම සියලු ජන නායකයන් වෙත දානය කර, දේශයේ අභිවෘද්ධිය සහ අනාගත සුරක්ෂිතතාව වෙත ලක් මාතාව මෙහෙයවන පිණිස,